ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
STU5511- අධ්‍යාපනික මනෝවිද්‍යාව
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ‘අධ්‍යාපනික මනෝවිද්‍යාව’ යන සංකල්පය ඔබේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ඉගෙනුම් ප්‍රතිඵල ඇගයීමට අධ්‍යාපනික මනෝවිද්‍යාව පිළිබඳ දැනුම විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඔබහට වැදගත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

03. ළමා චර්යා අධ්‍යයන ක්‍රමයන්ට අදාළව පර්යේෂණාත්මක අධ්‍යයන ක්‍රම සහ පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රම අතර වෙනස උදාහරණ තුනක් (03) ඇසුරින් දක්වන්න.

04. ‘පූර්ණ සංවර්ධනය’ යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ‘සූදානම’ යන සංකල්පය සහ ඉගෙනීමේ දී එහි ඇති වැදගත්කම උදාහරණ දෙකක් (02) දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

06. ඉගෙනුම් න්‍යායන්හි ප්‍රධාන කාණ්ඩ තුන (03) දක්වා, එක් එක් කාණ්ඩය යටතේ එක් න්‍යාය බැගින් සඳහන් කර, එම එක් එක් න්‍යායට අදාළ ප්‍රධාන මූලධර්ම දෙක (02) බැගින් සඳහන් කරන්න.

07. අනාවරණ ඉගෙනුමේ දී ගුරුවරයාගේ භූමිකාව උදාහරණ දෙකක් (02) ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. බැන්ඩුරාගේ නිරීක්ෂණාත්මක ඉගෙනුම් න්‍යායෙහි පියවර හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 X 08 =40)

## 2 වන කොටස

09. (i) නවයොවුන් වියේ සංවර්ධනය ආශ්‍රිත ලක්ෂණ හතරක් **(04)** පරීක්ෂා කරන්න. (ලකුණු 04)

(ii) නවයොවුන් වියේ දී සිසුන්ට මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත දැක් වූ ගැටලු විසඳා ගැනීමට ගුරුවරයෙකු ලෙස ඔබ සිසුන්ට සහය වන්නේ කෙසේද? සුදුසු උදාහරණ තුනක් **(03)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) 'වැඩීම' සහ 'සංවර්ධනය' අතර වෙනස උදාහරණ දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමයෙකුගේ වැඩීම සහ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ළමයෙකුගේ පූර්ණ සංවර්ධනය සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට දායක විය හැක්කේ කෙසේදැයි උදාහරණ හතරක් **(04)** ඇසුරින් පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව පුද්ගලයෙකුගේ ප්‍රජානන සංවර්ධනයේ ප්‍රධාන අවධි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කළ ප්‍රජානන සංවර්ධන අවධීන්ගෙන් එකක් **(01)** තෝරා ගෙන, එම තෝරාගත් අවධියට අදාළ චර්යා ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ප්‍රජානන සංවර්ධන අවධීන් පිළිබඳව සැලකිලිමත්වීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 10)

12. (i) 'කෙටි කාලීන ස්මෘතිය' සහ 'දිගුකාලීන ස්මෘතිය' අතර වෙනස උදාහරණ තුනක් **(03)** ඇසුරින් දක්වන්න. (ලකුණු 04)

(ii) විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඔබගේ සිසුන්ගේ මතකය වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග තුනක් **(03)** පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) ඉගෙනුම් මාරුව (පුහුණු මාරුව - Transfer of Learning) ගුරුවරයෙකුට සුසාධ්‍යකරණය කළ හැක්කේ කෙසේදැයි උදාහරණ හතරක් (04) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) 'ඉගෙනුමට අදාළව 'පෙළඹීම' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) පෙළඹීම පිළිබඳ මානවීය න්‍යායන්ගෙන්, එක් න්‍යායක් සඳහන් කර එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කළහැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) "අභ්‍යන්තර පෙළඹීම, පුද්ගලයෙකුගේ ඉගෙනුම සඳහා ඉතා වැදගත් ය." ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සිසුන්ගේ අභ්‍යන්තර පෙළඹවීම ඇති කිරීම සඳහා සුසාධ්‍යකරණය සැලසීමේ දී විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඔබගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i) ළමා චර්යා අධ්‍යයන ක්‍රම යටතේ ඇති පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රම හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කළ පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රම අතුරින් එකක් තෝරාගෙන, එහි ලක්ෂණ, ප්‍රබලතා සහ දුබලතා සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ගුරුවරයෙකු විසින් ළමා චර්යා අධ්‍යයන ක්‍රම පිළිබඳ දැනුම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කළ යුත්තේ කෙසේදැයි උදාහරණ තුනක් (03) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

( 20 X 3 = ලකුණු 60)

(මුළු ලකුණු = 100)

හිමිකම් ඇවිරිණි.